**විෂය - චිත්‍ර**

**කාර්ය පත්‍රිකා අංක 01**

**10 ශ්‍රේණිය** **2021 - 1 වාරය - ජනවාරි පළමු සතිය**

| | |
|---|---|
| නිපුණතාව 1.0 | : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි |
| නිපුණතා මට්ටම 1.1 | : මානව සහ සත්ව රූප ඇතුළත් පරිසරය පුළුල් ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි |
| ක්‍රියාකාරකම 1.1.1 | : " වරෙල්ලා වරෙල්ලා - වැල්ලට ඔරු ඇවිල්ලා " |
| කාලච්ඡේද සංඛ්‍යාව | : 02 |
| ඉගෙනුම් පල | : ධීවර ජන සංස්කෘතියේ ස්වභාවය විස්තර කරයි<br>ධීවර ජන ජීවිතයේ අභියෝගාත්මක බව ප්‍රකාශ කරයි<br>ධීවර ජන ජීවිතය පිළිබඳ ව සහකම්පනයෙන් කතා කරයි<br>ධීවර ජන ජීවිතයේ ස්වභාවයන් දැක්වෙන චිත්‍ර නිර්මාණය කරයි<br>නිම කළ කෘති රසවිඳියි, අගය කරයි |
| ඉගෙනුම් අත්වැල | : "හෝ හෝ හඬින් නිතර සංචල මුහුද ආශ්‍රිත පරිසරයේ ගහ කොළ ලවණ මිශ්‍ර සැඩ සුළඟින් නිතර ඒ මේ අත සැලේ. ඇඹරේ. කුඩා පැල්පත්වල වසන ධීවරයන් නිතර ම ක්‍රියාශීලි ව ගැහැණු, පිරිමි, ළමා ළපටි කිසිදු භේදයකින් තොර ව සාමූහික ව තම ජීවනෝපාය වන ධීවර කටයුතුවල නියැලේ. ඇතැමෙක් අව් කාෂ්ඨකයේ කර වෙමින් කරවල වේලති. කිහිප දෙනෙක් එක් ව දැවැන්ත ඔරුවක් මුහුදට දියත් කරන්නේ කෘෂ වූ ශරීර ශක්තියෙනි. මාළු වට්ටි හිසින් ගත් කාන්තාවෝ කිහිප දෙනෙක් අත් පා ලෙලවමින් කෑ මොර දෙන්නේ මුහුදේ හඬ පරයන්නට මෙනි. වැල්ලේ දුවන ළමුන් කිහිප දෙනෙක් අහසේ පියාඹන ලිහිණ රැන් දෙස ඕනෑකමින් බලා සිටී. වැල්ලට ආ ඔරුවලින් එලියට ගැනෙන මත්ස්‍ය සම්පත දෙස ඇතැමුන් බලා සිටින්නේ රටක් රාජ්‍යයක් ජය ගත්තාක් මෙනි.<br><br>ධීවර පරිසරයේ ඉහත ලක්ෂණ ඔබේ චිත්‍රට ගොනු කර ගන්න. උණුසුම්, කාර්ය බහුල පරිසරයේ ගති ස්වභාවය හැඟෙන දැනෙන සේ වර්ණ සංයෝජනය කරන්න. මානව රූපවල හැඟීම් දැනීම් ඉස්මතු කරන්න. වෙරලාශ්‍රිත පරිසරයේ සුන්දරත්වය ද අමතක නොකරන්න. |
| ඇගයීම | : " වරෙල්ලා වරෙල්ලා - වැල්ලට ඔරු ඇවිල්ලා " යන ඉහත තේමාව යටතේ චිත්‍රයක් ඇඳ වර්ණ ගන්වන්න. |